සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 25B | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

- මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ ඉන් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිලිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම / ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමග නොගැළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.

01. 1. බෙරිං 2. ජිබෝල්ට්‍රා 3. මැලැක්කා 4. බොස්පරස් 5. පැනමා (.....)

02. 1. ප්‍රංශය 2. රුසියාව 3. ස්පාඤ්ඤය 4. බෙල්ජියම 5. පෘතුගාලය (.....)

03. 1. බ්‍රසීලය 2. පීරු 3. මෙක්සිකෝ 4. කැලිකට් 5. රියෝද ජැනෙයිරෝ (.....)

04. 1. 2 වන ජූලියස් 2. 10 වැනි ලියෝ 3. 6 වැනි ඒඩ්‍රියන්
4. 2 වැනි කැතරින් 5. 7 වැනි ක්ලෙමන්ට් (.....)

05. 1. කෝර්සිකා 2. එල්බ් 3. සිසිලි 4. ඊජියන් 5. මෝල්ටා (.....)

06. 1. ජිනෝවා 2. බුඩාපෙස්ට් 3. වෙනීසිය 4. මිලාන් 5. ෆ්ලෝරන්ස් (.....)

07. 1. ඊස්කිලස් 2. සොෆොක්ලීස් 3. යුරිපිඩීස්
4. ඇරිස්ටෝෆෙනීස් 5. වර්ජිල් (.....)

08. 1. ස්ෆෝර්සා 2. මෙඩිචි 3. එස්තෙ 4. ගොන්සාගා 5. යෝර්ක් (.....)

09. 1. රුමේනියාව 2. බල්ගේරියාව 3. වියානාව 4. සර්බියාව 5. බොස්නියාව (.....)

10. 1. මැරට් 2. මැසිනි 3. ඩැන්ටන් 4. මිරාබෝ 5. රොබෙස්පියර් (.....)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. 1. පිරනීස් - කඳුවැටිය
2. රයින් - ගංගාව
3. ඩාඩනල්ස් - සමුද්‍ර සන්ධිය
4. සූවස් - මුහුද
5. ශාන්ත හෙලේනා - දිවයින (.....)

12. 1. ෆර්ඩිනන්ඩ් සහ ඉසබෙලා - ස්පාඤ්ඤය එක්සත් කිරීම
2. රිචලියු - නැන්ට්ස් ආඥාව අවලංගු කිරීම
3. VIII වැනි හෙන්රි - පාර්ලිමේන්තුව නොකැඳවීම
4. නැපෝලියන් බොනපාට් - ප්‍රංශයට නීති පද්ධතියක් සම්පාදනය කිරීම
5. I එලිසබෙත් - ස්පාඤ්ඤ ආමෙඩාව (.....)

13. 1. වැඩවසම් ක්‍රමය - වෙළඳාමේ දියුණුව
2. නව රාජාණ්ඩු ක්‍රමය - බලය සංකේන්ද්‍රගත කිරීම
3. ධනවාදය - බද්ධ ව්‍යාපාර සමාගම්
4. රෙපරමාදු ව්‍යාපාරය - කතෝලික සභාව බෙදීයාම
5. තිස් අවුරුදු යුද්ධය - ප්‍රංශයේ බලය වර්ධනය වීම (.....)

14. 1. V චාල්ස් - ශුද්ධ රෝම අධිරාජ්‍යා
2. ටැසිටස් - ලතින් සාහිත්‍ය
3. සොෆිගිනස් - ජූලියස් දින දර්ශනය
4. VII හෙන්රි - ටියුඩර් රාජවශංයේ ආරම්භය
5. II පිලිප් - එංගලන්තයේ පාර්ලිමේන්තුව පිහිටුවීම (.....)

15. 1. මේරි ටියුඩර් සහ වික්ටෝරියා - සහෝදරියෝ
2. ඉසබෙලා හා ජුවානා - මව සහ දියණිය
3. V වන චාල්ස් සහ II වන පිලිප් - පියා සහ පුතා
4. xvi ලූවී සහ මාරි ඇන්ටොයිනට් - රජු සහ බිසව
5. මාරිද මෙඩිචි සහ xiii ලූවී - මව සහ පුතා (.....)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල x හා y තීරුව ගලපා අනුපිළිවෙලට සකස් කළවිට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගය තෝරන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ගුසියාඩිනි | A | ආදම් සහ ඊට උද්‍යානයෙන් නෙරපීම |
| 2. | මැසැක්සිඕ | B | ඩේවිඩ් |
| 3. | බොට්ටිසෙල්ලි | C | වීනස්ගේ උපත |
| 4. | රෆායල් | D | II ජූලියස් පාප්තුමා |
| 5. | ඩොනටෙලෝ | E | ඉතාලියේ ඉතිහාසය |

1. EABDC 2. EACDB 3. ACBDE 4. BCADE 5. CABDE (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අරාබි | A | වැන්ඩල් විසිගොත් |
| 2. | ක්‍රිස්තියානි | B | එක්දහස් රැය |
| 3. | ග්‍රීක | C | පාතීනන් දේවස්ථානය |
| 4. | රෝම | D | මිලාන් ආඥාව |
| 5. | ම්ලේච්ඡ | E | ජස්ටීනියන් නීති ක්‍රමය |

1. BDECA 2. ADCEB 3. ABCED 4. BDCEA 5. DBCEA (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඉතාලිය | A | බ්‍රසල්ස් |
| 2. | අයර්ලන්තය | B | ස්ටොක්හෝම් |
| 3. | නොර්වේ | C | ඔස්ලෝ |
| 4. | ස්වීඩනය | D | රෝමය |
| 5. | බෙල්ජියම | E | ඩබ්ලින් |

1. DECBA 2. EDCBA 3. DCEBA 4. DABEC 5. DBCEA (.....)

19. **X** **Y**

| | X | | Y |
|---|---|---|---|
| 1. | ජෝන් වයික්ලිෆ් | A | ලන්දේසි |
| 2. | ජෝන් හස් | B | ඉංග්‍රීසි |
| 3. | ඉරාස්මස් | C | ස්විස් |
| 4. | උල්රිච් ස්විංග්ලි | D | ප්‍රංශ |
| 5. | ජෝන් කැල්වින් | E | බොහීමියන් |

1. EBACD 2. BEACD 3. BAECD 4. CDABE 5. AEBCD (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | 1815 | A | උත්කෘෂ්ඨ විප්ලවය |
| 2. | 1855 | B | වියානා සමුළුව |
| 3. | 1688 | C | ඔග්ස්බර්ග් සාම ගිවිසුම |
| 4. | 1453 | D | ඇමරිකානු ස්වාධීපත්‍ය ප්‍රකාශනය |
| 5. | 1776 | E | කොන්ස්තන්තිනෝපලයේ වැටීම |

1. BACED 2. BCADE 3. BCAED 4. ACBED 5. EABCD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ඇමරිකානු නිදහස් සටන,
    1. පැරිස් සාම ගිවිසුම අත්සන් කිරීමෙන් යුද්ධය අවසන් විය.
    2. ප්‍රථම සටන ලෙක්සින්ටන් හිදී ආරම්භ විය.
    3. ජෝර්ජ් වොෂිංටන්ගේ දක්ෂ නායකත්වය.
    4. සැමුවෙල් ඇඩම්ස්ගේ නායකත්වයෙන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධ වීම.
    5. සාමය, සමානාත්මතාවය, නිදහස, සටහන් පාඨය වීම. (.....)

22. කාර්මික විප්ලවය,
    1. එංගලන්තයෙන් ආරම්භ විය.
    2. ස්ටොක්ටන් ඩාලින්ටන් ප්‍රථම දුම්රිය මාර්ගය ඉදිකිරීම.
    3. සැමුවෙල් මොර්ස් විදුලි පණිවුඩ ක්‍රමය සොයා ගැනීම.
    4. හම්ප්‍රිඩේවි ආරක්ෂක පහන සොයා ගැනීම.
    5. සයිරස් ඩබ්ලිව් පීල් කේබල් ක්‍රමය සොයා ගැනීම. (.....)

23. පුනරුදය,
    1. පුනරුදය ඉතාලියේ ආරම්භ විය.
    2. ආගමික ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස එය හටගත්තේය.
    3. පුනරුදය පසුකාලයේ දී යුරෝපයේ අනෙකුත් රටවලට පැතිරුණි.
    4. පුනරුද සමාජයේ ලෞකිකත්වයට නැඹුරු වූ දෘෂ්ටියක් වර්ධනය විය.
    5. පුනරුදයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මානව වාදයයි. (.....)

24. තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා,
    1. බොහිමියන් 2. නෝර්වීජියන් 3. ඩෙන්මාර්ක් 4. ස්විඩන් 5. ප්‍රංශ (.....)

25. ජාතික රාජ්‍ය
    1. බලය රජු වෙත සංකේන්ද්‍ර ගතවූ ශක්තිමත් රාජාණ්ඩුවකි.
    2. ශක්තිමත් වැඩවසම් රදළ පන්තියක් ඇත.
    3. ශක්තිමත් ස්ථාවර හමුදාව.
    4. වෙළඳාමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
    5. රජවරුන් මධ්‍යම පන්තියේ ආධාර ලබා ගැනීම. (.....)

- **26 - 30 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.**

**A සහ B පමණක් නිවැරදි නම් අංක 1 ද** **B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද**
**C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද** **A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද**

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පහත දැක්වෙන සාධක අතුරෙන් මුල් කාලීන දේශගවේෂණයට සම්බන්ධ තොරතුරු මොනවා ද ?
    A) ආසියාව සමග බලපෑම් කිරීමට ස්පාඤ්ඤ හා පෘතුගීසින් තුල වූ ආශාව.
    B) කොන්ස්තන්තිනෝපලය තුර්කීන් යටත් කර ගැනීම.
    C) ජර්මනියේ කතෝලික ප්‍රතිසංස්කරණ.
    D) එංගලන්තයේ කාර්මික විප්ලවය. (.....)

27. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්‍ෂණය වන්නේ,
    A) බල විකේන්ද්‍රණය B) ස්වයංපෝෂී බව
    C) ආගමික ප්‍රතිසංස්කරණ D) ඒකාධිපති රාජාණ්ඩුව (.....)

28. කාර්මික විප්ලවයේ ප්‍රතිඵල මොනවා ද ?
    A) ගෘහාශ්‍රිත කර්මාන්ත දියුණුවීම. B) විශාල කර්මාන්තශාලා බිහිවීම.
    C) පරිසර දූෂණය D) වෙළඳාම පුළුල් වීම. (.....)

29. පහත සඳහන් කරුණු අතුරෙන් පෞර රාජ්‍යවල ලක්ෂණ මොනවා ද ?
    A) ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම පැවතීම.
    B) තම භාණ්ඩ අලෙවි කර ගැනීමට වෙළඳ මධ්‍යස්ථානයට පැමිණීම.
    C) නගර කේන්ද්‍ර කොට පාලකයා ගොඩනගා ගැනීම.
    D) විශාල භූමි භාග වලින් සමන්විතය. (.....)

30. පහත දැක්වෙන්නන් අතුරෙන් ප්‍රංශ විප්ලවයේ නායකයෝ කවරහු ද ?
    A) ස්ටාලින් B) ඩේරියස් C) මිරාබෝ D) ඇබේසියස් (.....)

- **අංක 31 - 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. පාර්ලිමේන්තුවේ පියා ලෙස හඳුන්වන්නේ කවු ද ?
    1. පළමුවන එඩ්වඩ් රජු 2. තුන්වන හෙන්රි රජු 3. දෙවන එඩ්වඩ් රජු
    4. දෙවන හෙන්රි රජු 5. තුන්වන ජෝන් රජු (.....)

32. ස්පිනිං ජෙනි යන්ත්‍රය නිපදවූයේ කවු ද ?
    1. ජෝන් කේ 2. ජේම්ස් හාග්‍රිවුස් 3. ජේම්ස් වොට්
    4. එලී විට්නි 5. හෙන්රි කෝට් (.....)

33. ඇමරිකානුවන් නිදහස් ප්‍රකාශනය නිකුත් කලේ කුමන වර්ෂයේ ද ?
1. 1776 2. 1774 3. 1765 4. 1779 5. 1781 (.....)

34. රුධිර සංසරණ ක්‍රමය සම්පූර්ණයෙන් සොයා ගත්තේ කවු ද ?
1. පැරසල්සස් 2. මයිකල් 3. කෙප්ලර්
4. විලියම් හාවේ 5. අයිසැක් නිවුටන් (.....)

35. කුරුස යුද්ධ ඇතිවූයේ කවර ජන කොටස් අතර ද ?
1. රෝමවරුන් හා කාර්තේජවරුන් අතර
2. රෝමවරුන් හා ගොත්වරුන් අතර
3. වයිකිංවරුන් හා මායාවරුන් අතර
4. ක්‍රිස්තියානි භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයන් අතර
5. ටියුටොනික්වරුන් හා ස්ලාව්වරුන් අතර (.....)

- **අංක 36 - 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි. දැක්වෙන 1,2,3,4,5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |
| | | |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. දේශපාලන වැඩවසම් ක්‍රමය ප්‍රධාන වශයෙන් දේශපාලන බල විකේන්ද්‍රණය වූ ක්‍රමයකි. | viii වන හෙන්රි විසින් එංගලන්තයේ රෙපරමාදු ව්‍යාපෘතිය ඇරඹීය. (.....) |
| 37. ලොරෙන්සෝද මෙඩිචි පුනරුද සමයේ ඉතාලියේ කලාකරුවනට අනුග්‍රහ දැක්වීය. | කොලොම්බස් ලොව වටා යාත්‍රා කර පෘථිවිය ගෝලාකාර බව සනාථ කළේය. (.....) |
| 38. උල්රිච් ස්විංග්ලි ජර්මනියේ ආගමික ප්‍රතිසංස්කරණයට නායකත්වය දැරීය. | මධ්‍යකාලීන යුරෝපයේ පැවති ආගමික එක්සත් බව රෙපරමාදු ව්‍යාපාරයක් සමග අවසන් විය. (.....) |
| 39. අයිසැක් නිවුටන් මුද්‍රණ යන්ත්‍රය සොයා ගන්නා ලදී. | ප්‍රංශය ජාතික රාජ්‍යයක්වීමේ දී ෆර්ඩිනන්ඩ් කුමාරයාගෙන් මෙහෙයක් ඉටු විය. (.....) |
| 40. ඉග්නේෂස් ලොයෙලා විසින් ජේසු සංගමය පිහිටුවන ලදී. | ජෝන් කැබෝ කේප් බ්‍රිටන් දූපත සොයා ගන්නා ලදී.(.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 25B | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................

යුරෝපා ඉතිහාසය II

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ ආකෘති සිතියමක් සපයා ඇත.**

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) ක්‍රීටය | (ii) අයෝනියන් මුහුද | (iii) ප්‍රංශය | (iv) මැන්චෙස්ටර් |
| (v) යූරල් කඳුවැටිය | (vi) රයින් ගඟ | (vii) මැඩ්රිඞ් | (viii) බොස්පරස් |
| (ix) ඩැන්සිග් | (x) බර්ලින් | (xi) ඉංග්‍රීසි ඕඩය | (xii) වියානා |

(ල. 12)

02. ''රෝමවරුන් ඔවුන් ගොඩනැගූ විශාල අධිරාජ්‍යයේ වාසය කළ සියලු ජන කොටස් සඳහා සාමය, සමාදානය, සහතික වන පාලන ක්‍රමයක් ගොඩනගන ලදී.''

(i) බටහිර හා නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවරවල් පිළිවෙළින් නම් කරන්න. (ල. 2)

(ii) රෝම අධිරාජ්‍යවරු තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(iii) රෝම පාලන ක්‍රමය, සාහිත්‍ය හා ගෘහ නිර්මාණ කලාව, ආගම, අධ්‍යාපනය යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 11)

03. ''මධ්‍යකාලීන යුරෝපය, නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධානතම සාධකය වූයේ පුනරුදයයි.''

(i) යුරෝපයේ පුනරුදය යනු කුමක් ද ? (ල. 2)

(ii) 1453 දී කොන්ස්තන්තිනෝපලය ඔටෝමන් තුර්කීන් අතට පත්වීම පුනරුදය කෙරෙහි බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 5)

(iii) පුනරුද අවධියේ ඇති වූ දේශපාලන සහ ආර්ථික වර්ධනය ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 9)

04. ''පාර්ලිමේන්තුවේ වර්ධනයත් සමඟ එංගලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් විකාශනය විය.''

(i) එංගලන්තයේ පාර්ලිමේන්තුව හා සම්බන්ධ ප්‍රධාන ආයතන නම් කරන්න. (ල. 3)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ හතරක් දක්වන්න. (ල. 4)

(iii) පාර්ලිමේන්තු ක්‍රමය වර්ධනයවීමේ දී එංගලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් විකාශනය වූ අයුරු සාකච්ඡා කරන්න. (ල. 9)

05. පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් තිස් අවුරුදු යුද්ධය යුරෝපයේ සන්ධිස්ථානයක් වූ අයුරු පරීක්ෂා කරන්න.

(i) තිස් අවුරුදු යුද්ධයට බලපෑ ආගමික සහ දේශපාලන හේතු

(ii) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල

(iii) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම (ල. 16)

06. ''කාර්මික විප්ලවය හේතු කොටගෙන යුරෝපයේ සෑම ක්ෂේත්‍රයකම පරිවර්තනයක් සිදුවිය.''

(i) කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න. (ල. 1)

(ii) කාර්මික විප්ලවයට බලපෑ ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් නම් කරන්න. (ල. 3)

(iii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 12)

07. ''ඇමරිකානු නිදහස් සටන යුරෝපයට දැඩි බලපෑමක් ඇති කළේය.''

(i) ඇමරිකාවේ මුල් ජනපදික ගෝත්‍ර 3ක් නම් කරන්න. (ල. 3)

(ii) ඇමරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න. (ල. 1)

(iii) ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය වූයේ කුමක් ද ? (ල. 1)

(iv) ඇමරිකාවේ ජනපද පිහිටවූ රටවල් 3ක් නම් කරන්න. (ල. 3)

(v) උතුරු ඇමරිකාවේ තිබූ ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න. (ල. 3)

(vi) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 5)

08. ''පැරණි රාජාණ්ඩු ක්‍රමය ප්‍රංශ විප්ලවයට මඟ පෑදීය'' විමසන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි ඓතිහාසික සටහන් ලියන්න.


(i) ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය

(ii) පර්ඩිනන්ඩ් ඉසබෙලා

(iii) වැඩවසම් ක්‍රමයේ පිරිහීම

(iv) ප්‍රංශය ජාතික රාජ්‍යයක් වීම (ල. 8 බැගින් 8 x 2 = 16)

විභාග අංකය
சுட்டெண்



## තෙවන වාර පරීක්ෂණය 2019 - යුරෝපා ඉතිහාසය - පිළිතුරු
## 12 ශ්‍රේණිය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. - | 5 | 11. - | 4 | 21. - | 5 | 31. - | 1 |
| 02. - | 2 | 12. - | 3 | 22. - | 3 | 32. - | 2 |
| 03. - | 4 | 13. - | 1 | 23. - | 2 | 33. - | 1 |
| 04. - | 4 | 14. - | 5 | 24. - | 2 | 34. - | 4 |
| 05. - | 4 | 15. - | 1 | 25. - | 2 | 35. - | 4 |
| 06. - | 2 | 16. - | 2 | 26. - | 1 | 36. - | 2 |
| 07. - | 5 | 17. - | 4 | 27. - | 1 | 37. - | 1 |
| 08. - | 5 | 18. - | 1 | 28. - | 5 | 38. - | 5 |
| 09. - | 3 | 19. - | 2 | 29. - | 3 | 39. - | 3 |
| 10. - | 2 | 20. - | 4 | 30. - | 3 | 40. - | 2 |

## II කොටස

01.



සිතියමෙහි අදාළ ස්ථාන ලකුණු කොට නම් කරන්න. (ල. 12)

02. (i) රෝමය හා බයිසැන්තියම (ල. 2)

(ii) ඔගස්ටස්සීසර්, නීරෝ, කැරකැල්ලා, කොන්ස්ටන්ටයිස්, ජස්ටීනියන්, මාකස් අවුරේලියස්, ඩයොක්ලිෂන් (ල. 3)

(iii) **රෝම පාලන ක්‍රමය**

* සමූහාණ්ඩු හා අධිරාජ්‍ය පාලනය
* ප්‍රාදේශීය හා පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වීම.
* කොන්සල්වරුන්ගේ පාලනය.
* ජස්ටීනියන් නීති පද්ධතිය.

**සාහිත්‍ය හා ගෘහ නිර්මාණ කලාව**

* ලතින් භාෂාව ප්‍රධාන වීම.
* ඔගස්ටස් සීසර් රෝම සාහිත්‍යයේ දියුණු යුගයක් වීම.
* ඔගස්ටස් අධිරාජ්‍යයාගේ කාලයේදී වර්ජිල්, හොරේස්, ලිවී ඔවිඩ් යන ලේඛකයන් වැදගත් වීම.
* ලතින් සාහිත්‍ය දියුණු වීම.
* පුවත්පත් කලාව, පොත් බැඳීමේ ක්‍රම.
* සැප පහසු අංගවලින් යුත් ගොඩනැගිලි නිර්මාණය.

* විශාල ගොඩනැගිලි, ආරුක්කු, ගෝලාකාර ශිඛර.
* කොන්ක්‍රීට් ක්‍රමය, වර්ණ භාවිතය, මැටි බඳුන් පිංතාරු කිරීම, ප්‍රතිමා නිර්මාණය.
* මේවා උදාහරණ සහිතව විස්තර කළ යුතුවේ.

**ආගම**

* සංවිධානාත්මක ආගමක් නොතිබීම.
* බහුදේව වාදය පැවතීම.
* භූතාත්ම වන්දනය.
* මව් දෙවගන ඇදහීම.
* අධිරාජ්‍යවරුන් දේවත්වයෙන් වන්දනය.

**අධ්‍යාපනය**

* පැරණි රෝම සිරිත් විරිත් හා සම්ප්‍රදායන් දෙමව්පියන් විසින්ම උගන්වන ලදී.
* මුලින්ම ග්‍රීක වහල්ලු සහ නිදහස ලත් වහල්ලු රෝමයේ ගුරු වෘත්තියට එක් විය.
* ස්පුරියස් කාවිලියම් නම් වහල්ලා මුදල් අයකරන පාසලක් ආරම්භ කරන ලදී.
* ග්‍රීක සහ ලතින් කාව්‍ය, කථිකත්වය, නීතිය, වෛද්‍ය විද්‍යාව යුද්ධ ශිල්පය වැනි විෂයන් ඉගැන්වූහ.

ඉහත සඳහන් තොරතුරු මඟින් රෝම ජන ජීවිතය සකස් වූ අයුරු උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 4)

03. (i) * මධ්‍යකාලීන යුරෝපය නූතන යුරෝපය බවට පත්වීමේ දී දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික ආදී සියලු ක්ෂේත්‍රවල ඇති වූ නව පිබිදීම පුනරුදය නම් වේ.
නැතහොත්
* පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල ඇති වූ නව පිබිදීම. (ල. 2)

(ii) * පෙරදිගට වැටී තිබූ ගොඩබිම් මාර්ග වැසීම නිසා දේශගවේෂණ වලට යොමු වීමත් එමගින් යුරෝපයේ නවෝදයක් ඇති වීමත් විස්තර කළ යුතුය.
* කොන්ස්තන්තිනෝපලයේ තිබූ පැරණි ග්‍රීක රෝම දාර්ශනිකයන්ගේ පොත්පත් යුරෝපයට ගෙන යාම නිසා බොහෝ දෙනෙකුගේ බුද්ධි ප්‍රබෝධයක් ඇතිවීම. (ල. 5)

(iii) **දේශපාලන**

* නව රාජාණ්ඩුක්‍රම ඇතිවීම.
* රජුගේ බලය සංකේන්ද්‍රගත වීම.
* රදළ බලය බිඳ වැටීම.
* රජුට යටත් වූ ස්ථිර වැටුපක් සහිත හමුදාව

**ආර්ථික**

* වෙළඳාම දියුණු වීම.
* මුදල් බලය දියුණුවීම / ප්‍රවේණි ක්‍රමය බිඳ වැටීම.
* නගර ඇති වී දියුණු වීම / බැංකු ක්‍රම / විනිමය ක්‍රම.
* බද්ධ ව්‍යාපාර සමාගම්
* යටත් විජිත අධිරාජ්‍යයක් ගොඩනැගීම. (ල. 9)

04. (i) * කිරීටය (රජු හෝ රැජින) * සාමි මන්ත්‍රි මණ්ඩලය * මහජන මන්ත්‍රී මණ්ඩලය (ල. 3)

(ii) * සර්ව ජන ඡන්ද බලය හිමිවීම. * නිරතුරුව මැතිවරණ පැවැත්වීම.
* මහජනතාව සියලු දෙනාම සමාන තත්වයෙන් සැලකීම.
* මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම.
* බලයේ ප්‍රධාන උල්පත ජනතාව බව පිළිගැනීම. (ල. 4)

(iii) * 1215 මැග්නා කාර්ටා පනත සම්මත වීම.
* ස්ටුවර්ට් රජවරුන් හා පාර්ලිමේන්තුව අතර ප්‍රමුඛස්ථානය සඳහා අරගල පැවතීම.
* I චාල්ස් රජුගේ කාලයේ ඇති වූ සිදුවීම්.
* 1688 උත්කෘෂ්ඨ විප්ලවය ක්‍රියාත්මක වීම.
* ජනතා නියෝජිත ක්‍රමයේ වර්ධනය ඉහත කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 9)

05. (i) * ඔග්ස්බර්ග් සම්මේලනයේ දුර්වලතා
* රෝමානු කතෝලිකයන් හා ලූතර්වාදීන්ට පමණක් ආගමික නිදහස ලැබීය.
* කැල්වින්වාදීන්ට වරප්‍රසාද නොලැබීම.
* බොහීමියාවේ පාලකයා තෝරා ගැනීමේ දී ඇති වූ තත්වය.
* ප්‍රංශ බූර්බෝන් හා ජර්මනියේ හැජස්බර්ග්වරුන් අතර තිබූ වෛරය.

(ii) * මිනිස් සම්පත්, ධන සම්පත් ඇතුළු සියලු භෞතික සම්පත් විනාශ වීම.
* ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලය අඩු වීම.
* ප්‍රංශය යුරෝපයේ නායකත්වය ගැනීම හා ජර්මනිය අන්ත දුක්ඛිත තත්වයට පත්වීම.

(iii) * 1648 දී ඇතිවිය.
* රෝමානු කතෝලිකයන් හා ලූතර්වාදීන් භුක්තිවිඳි විශේෂ වරප්‍රසාද කැල්වින්වාදීන්ටද හිමි වීම.
* ජර්මනියේ පාලකයාගේ ආගම පාලිතයාගේ ආගම විය යුතු බව.
* ප්‍රංශයට ප්‍රදේශ කිහිපයක් ලැබීම.
* ස්විට්සර්ලන්තයට හා නෙදර්ලන්තයට නිදහස ලැබීම.
* ජර්මන් කුමාරවරුන්ට ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව ලැබීම.
* ජර්මනිය එක්සත්වීම පමාවීම.
* ප්‍රංශයට කීර්තිය හා නායකත්වය ලැබීම. (ල. 16)

06. (i) එංගලන්තය (ල. 1)

(ii) පේෂකර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය, යකඩ හා වානේ. (ල. 3)

(iii) * ගෘහ කර්මාන්ත බිඳ වැටීම. * ගම් වෙනුවට නගර බිහිවීම.
* පරිසර දූෂණය. * ධනවාදී ආර්ථිකය.
* මුදල් මත රැඳුණු පන්ති ක්‍රමය * නව අධිරාජ්‍යවාදය.
* වෘත්තීය සමිති, මාක්ස්වාදය, ලිබරල්වාදය ඇතිවීම. (ල. 12)

07. (i) * රතු ඉන්දියන්වරු * මායාවරු * ඉන්කාවරු * ඇස්ටෙක්ස්වරු
* හොප්වෙල්, ඉරොක්කොයිස්, පියුබ්ලෝ (ල. 3)

(ii) ජෝර්ජ් වොෂිංටන් (ල. 1)

(iii) නියෝජනයක් නැතිනම් බදුන් නැත (ල. 1)

(iv) එංගලන්තය, පෘතුගාලය, ප්‍රංශය, ස්පාඤ්ඤය (ල. 3)

(v) ඩෙල්වෙයාර්, මේරිලන්ඩ්, පෙන්සිල්වේනියා, නිව් හැම්ෂයර්, උතුරු කැරොලිනා, දකුණු කැරොලිනා, නිව්යෝර්ක්, ජෝර්ජියාව, මැසචුසෙට්ස්, වර්ජිනියාව, කනෙක්ටිකට්, රෝඩ්, නිව් ජර්සි (ල. 3)

(vi) * නිදහස් සටන ජය ගැනීමෙන් පසු ඇමරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යය පිහිටුවීම.
* බ්‍රිතාන්‍යයෙන් නිදහසලත් ප්‍රථම රාජ්‍ය වීම.
* ස්වාධීනතා ප්‍රකාශය නිකුත් කිරීම.
* පළමු ඉංග්‍රීසි අධිරාජ්‍යයේ අවසානය සලකුණු කිරීම.
* ප්‍රංශ විප්ලවය ඇතිවීම කෙරෙහි බලපෑම.
* $19^{C}$ ලතින් ඇමරිකාවේ, ස්පාඤ්ඤ හා පෘතුග්‍රීසි ආධිපත්‍යයන්ට එරෙහිව ඇති වූ නිදහස් සටන් කෙරෙහි මෙම විප්ලවය බලපෑම. (ල. 5)

08. * ප්‍රංශය ජාතික රාජ්‍යයක් වීමෙන් පසු රාජාණ්ඩු ක්‍රමය එහි මුල් බැස ගැනීම.
* ප්‍රංශයේ ලුවී රජවරුන්ගේ පාලනය යටතේ ඉහළ පෙළේ අය විශේෂ වරප්‍රසාද භුක්ති විඳීම.
* 14 ලුවී රජු විශාල මුදලක් වැයකොට වර්සෙල්ස් මාළිගය ඉදි කිරීම.
* රදළයින් වරප්‍රසාද භුක්තිවිදින කිසිම කාර්යක් නොකළ පිරිසක් වීම.
* චින්තකයින්ගේ අදහස් නිසා ජනතාව රාජාණ්ඩුවට එරෙහිවීම.
* 15, 16 වන ලුවී රජවරුන්ගේ අදූරදර්ශී ක්‍රියා.
* රජවරුන්ගේ සුඛෝපභෝගී ජීවිතය නිසා භාණ්ඩාගාරය හිස්වීම.
* එය පියවීමට ජනතාවගෙන් බදු අයකිරීම.
* මධ්‍යම පාන්තිකයන්ට නිසිතැන නොලැබීම.
* බදු නිසා ජනතාව දුගීවීම.
* 1789 ජූලි 14 දා බැස්ටීලයට පහරදීමෙන් රාජ්‍ය විරෝධී ප්‍රංශ විප්ලවය ආරම්භ විය. (ල. 8 x 2)

09. අදාළ පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.